මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல.02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

මාධ්‍ය නිවේදන අංක : 2026/04 2026.03.30

**ඉ සේවා මගින් මැතිවරණ කොමිෂන් සභාවේ සේවාවන් ලබා දීම.**

**මැතිවරණ කොමිෂන් සභාවෙන් සේවාවන් ලබා ගැනීමට අවශ්‍ය පුද්ගලයන් සඳහා ග්‍රාම නිලධාරි කාර්යාල වෙත හෝ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වෙත හෝ මැතිවරණ කොමිෂන් සභාව වෙත හෝ නොපැමිණ මැතිවරණ ඉ සේවාව මගින් තම අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා වන ක්‍රියා මාර්ග පුළුල් කර ඇත.**

https://eservices.elections.gov.lk සබැඳිය මගින් හෝ පහත සැණ පිළිසර කේතය (QR Code) මගින් හෝ ec.lk/es මගින් මැතිවරණ ඉ සේවාව වෙත පහසුවෙන් පිවිසිය හැකි අතර ඒ මගින් අන්තර්ජාල සබඳතාව සහිත ඕනෑම පරිගණකයක් හෝ සුහුරු ජංගම දුරකතනයක් මගින් තමා සිටින ස්ථානයේ සිටම දවසේ ඕනෑම වේලාවක මැතිවරණ කොමිෂන් සභාවෙන් ලබා ගැනීමේ හැකියාව පවතී.

**මෙම QR කේතය පරිලෝකනය (Scan) කිරීම තුළින්,**

- 2026 ඡන්ද හිමි නාමලේඛන ප්‍රතිශෝධනයට අදාලව ඡන්ද හිමි නාමලේඛන කෙටුම්පත් තොරතුරු පරීක්ෂාව සහ ඡන්ද හිමි නාමලේඛනයේ ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කිරීමට හෝ පදිංචි ස්ථානය මාරු කර ගැනීම සඳහා මාර්ගගතව ඉල්ලුම් කිරීම;
- වයස අවුරුදු 18 සම්පූර්ණ වූ මෙතෙක් ඡන්ද හිමි නාමලේඛනයට නම ඇතුළත් වී නොමැති පුරවැසියන් හට ඡන්ද හිමි නාමලේඛනයට නම ඇතුළත් කරවා ගැනීම;
- වයස අවුරුදු 18 සම්පූර්ණ නොවූ නමුත් ජාතික හැඳුනුම්පත ලබාගත් යොවුන් පුරවැසියන් හට ඉදිරියේදී ඡන්ද හිමි නාමලේඛනයට නම ඇතුළත් කර ගැනීම;
- 2015 වසරේ සිට මේ දක්වා ඡන්ද හිමි නාමලේඛනයේ ලියාපදිංචි තොරතුරු ලබා ගැනීම, ලියාපදිංචි තොරතුරු ඇතුළත් මැතිවරණ කොමසාරිස් ජනරාල්ගේ අත්සන සහිත ඡන්ද හිමි ලියාපදිංචි ප්‍රකාශය ලබා ගැනීම;
- අබාධ සහිත පුරවැසියන්ට ඡන්දය ප්‍රකාශ කිරීමට අවශ්‍ය විශේෂ අවශ්‍යතා මැතිවරණ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමේ අවස්ථාව; ද සලසා ඇත.

මැතිවරණ ඉ සේවා වෙබ් අඩවියට පිවිස එහි ඇති පුරවැසියන් සඳහා වන යොමුව මගින් මෙම සියලු සේවා ලබා ගත හැකි අතර, එක් එක් සේවා ලබා ගැනීමට අවශ්‍ය උපදෙස් එම එක් එක් සේවා අඩංගු ද්වාරය (Portal) මත දක්වා ඇති බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

රසික පීරිස්
මැතිවරණ කොමසාරිස් ජනරාල්